ඒ දණ්ඩේ මැද දී අත්වැල කැඩුණා

ඒ දණ්ඩේ යන ගමන පණ්ඩිතයන්ට පමණක් නොවෙයි - සාමාන්‍ය උදවියටත් අවදානම් වැඩක්. ඒ නිසා තමයි, අල්ලා ගෙන යන්නට වැලක් - රිටක් - දමන්නේ. ඒ දණ්ඩේ මැදක් ගියාට පස්සේ පිහිටට තියෙන අත්වැලත් කැඩී ගියහොත් ඉස්සරහට ගියත් අඩමානයි, ආපසු එන එකත් අඩමානයි.

ඒ දණ්ඩ දැන් ගම්වල පවා අභාවයට යන විරල දෙයකි. එසේ වුවද පාලම් දමන්නට කලින් ගිය අනතුරුදායක ගමන ගැමියන්ට මතකය. ඒ නිසාය, කරන්නට පටන් ගත් වැඩකට නොහොත් ජීවිතයට තිබුණු එකම පිහිට නැති වි යාම ගැන කියන්නට ඒ දඬු කතාව යොදා ගත්තේ.
අත්වැල අල්ලා ගෙන මා සැරසෙන්නෙ ගැමි වහරට අතින් ඉටු වී ඇති මෙහෙය ගැන විපරම් කරන්නට ය.

අත වනන්නේ නැතිව ගමන් කළ නොහැකිය. එහෙත් අත වන වනා ගෙදරකට යාම හරි නැති බවය බොහෝදෙනා සළකන්නේ. පුංචි එවුන්ට සීනි බෝල ටිකක්වත් අරගෙන යන්නේ නැතිව, තවත් විටක අපි අතින් ගෙන යන්නට බැරි තරම් පොදියක් ඔසොවා

ගෙන යන්නෙමු. ඒ අතින් කටින් උස්සා ගෙන යන කොටය. අතගැමෙ එකක්. අතපත ගෑමත් ඊට වෙනස් නැත. එහෙත් අතපත ගගා සිටීම වැඩ දිග් ගැසීමක් පමණකි.

අත ගැසීම කිහිප විදියකින් කරන්නට පුලුවන්.. මල් වට්ටියට නැතහොත් පිරිකරට අත ගසන්නේ ඒ පිනෙන් ටිකක් ඩැහැ ගන්නා චේතනාවෙනි. මම නම් ඔය වැඩේට අත ගසන්නේ නැහැ කියන්නේ අතින් කරන වැඩක් ගැන නෙවෙයි. හවුල් වීමක්. මිනිහා අත ගැහුවොත් ඕක විනාසයි, කියා කියන්නේ වැඩ අවුල් කරන්නකු හවුල් වන්නට ගිය විටකය. පෙළපාලියේ යන සටන්කාමීනු අත තිව්වොත් බලා ගෙනයි ඉ කියන්නේ තරවටුවක් ලෙසින්ය. එතැන අත තියන්නේ හොඳ ගිතකින් නොවේ. ලබ්බට තියාපු අතමයි පුහුලටත් ඉ කියන තැනදීත් අර විදියේම අහිත කර චේතනාවක් ඉඟි කැරෙයි.

අත දැමීම අත ගැහිල්ලට වඩා ටිකක් වෙනස්ය. හානියක් සිදු නොවන්නට පුළුවන. එහෙත් වාසියක් ගන්නට ගිතාගෙන කරන දෙයක් වන්නට ඉඩ ඇත. ඒ නිසා විය යුතුයි අත දාන්නට දුන් කල සමහරුන් ඔළුවත් දා ගන්නට බලන්නේ. අල්ලා ගැනීමත් ඒ ළඟින්ම යන ක්‍රියාවකි. සමහරෙක් අල්ලා ගත් කල කොහොමටත් අත නාරිති.

අතදීම අහිතක් නැතිව කරන දෙයකි. ආචාර කිරීමේ විදියක් හැටියට එය කිරීම චාර්‍යයයි. නැති බැරි කෙනකුට නැතහොත් දියුණු වන කෙනකුට අතදීම යහපත් මිනිසුන්ගේ ගතියකි. අත දී දත නියවීමේදී නම් ආයෙත් හිතේ කහටක් මතු වන්නට ඉඩ ඇත. සල්ලි ගනුදෙනු වලදීද අතට වැදගත් තැනක් ලැබෙයි. අතමිට කිසිවක් නැති විට ගනු මිසක් දෙනු නැත. එසේ කල්ගි කාගෙන් හරි අතමාරුවක් ලබාගත යුතු වෙයි. අතමිට නැතිව සමහර කන්තෝරුවලට ගිහින් වැඩක් නොවන්නේ යමක් කරවා ගන්නට සුළු මුලාදෑනියකුට කියක් හරි අතමිට මොළවන්නට ඕනෑ නිසාය. ලොකු ලොකු ගණුදෙනුවලදී අතයට සල්ලිදීමත් අවශ්‍ය වෙයි. නැතහොත් වාසිදායක වෙයි.

තාන්නමාන්න ලාබ පොරොජන දෙන්නට පොරොන්දු වන සමහරුන් කතා කරන්නේ හරියට ඒවා තමන්ගේ අතේ තියෙන්නා වාගේය. වැඩය ගැන ඒ තරමටම ඔවුන්ට විශ්වාසය. එසේ නැත්නම් ඔවුහු මහා වංචාකාරයෝය. මගුල් කපුවන්ගේ භාෂාවේ බෙහෙවින් මෙය දක්නට ඇත. තරුණයකුට නොහොත් තරුණියකට ගැලපෙන මනාලියක නොහොත් මනාලයකු තමන් අතේ තියන බවය ඔවුන් කියන්නේ.

දුර මැනීමට කෙසේ වෙතත් කීමට ද අත

කස්තිරම

ඩී බී කුරුප්පු

> අත ගැසීම කිහිප විදියකින් කරන්නට පුලුවන්ය.. මල් වට්ටියට නැතහොත් පිරිකරට අත ගසන්නේ ඒ පිනෙන් ටිකක් ඩැහැ ගන්නා චේතනාවෙනි.

ප්‍රයෝජනවත් වෙයි. අතේ දුරක තියෙන දෙය නොහොත් තැනට ළංවන්නට තව ටිකක් යායුතු වෙයි.

එහෙත් ළඟ ළඟම බව නම් සහතිකය. අතේ දුරින් යමකු තබා ගන්නාවිට පුද්ගලයා අරිට වඩා ළඟින් සිටින්නට ඉඩ ඇත. එහෙත් එතැන දුර අඩි යාර ගණනින් දැක්වෙන්නක් නොවේ. සුහදතාව - ගනුදෙනුව පිළිබඳ වූවකි. අත්ල පමණක් මිනුමට ගන්නා තැනක්ද ඇත. ඒ අල්ල මිම්මට යමක් කරන කල්හිය. දළ මිනුමක් ඉ අල්ලේ කරන තවත් ක්‍රීඩාවක් ඇත. ඒ සල්ලි නැටවීමය. දේශපාලකයන් අල්ලේ නටවන්නට සමත් මුදලාලිලා කරන්නේ ඒ සෙල්ලමය.

.... අත සෝදා ගැනීමේ නොයෙකුත් ක්‍රම ඇත. කෑමට පෙර හෝ කෑමෙන් පසු අතසෝදා ගැනීම පහසුම ක්‍රමයයි. අවදානම් වැඩකට නැත්නම් අප අනුමත නොකරන වැඩකට හවුල් නොවන්නට තීරණය කළ විටත් අපි අත සෝදා ගෙන පැත්තකට වෙන්නෙමු. පිටිසර ගම්වල වැසිකිළි භාවිතය නහවුරු වන්නට කලින් උදේ පාන්දරින් බඩ වැටියකට රිංගා රාජකාරිය හමාර කරන ගැමියකු ඇලට බසා අතපය සෝදා ගෙන ගෙදර එනවා දක්නට තිබිණ. ඔහු එතැන සෝදන්නේ අර දෙකෙන් එකක් වත් නොවේ. අතපය ලොකු කළායින් පස්සේ දරුවන්ගෙන් බැණුම් අසන අම්මලා කර ඇත්තේ අතපය දෙක ගැන සැළකීමකට වඩා බැරෑරුම් රාජකාරියකි. කොයිතරම් මහන්සි වෙලා වැඩකළත් සමහරුන්ට අතපය දිග හැරලා ඉන්නට ලැබෙන්නේ නැත.

සමහරකුගේ අතින් ඇටයක් ඉන්දුවහොත් එයින් බලා ඉන්දැද්දි පැලයක් වැඩෙන්නේය. එබන්දන්ගේ අතින් අල්ල වතුර ටිකක් දුන්නත් පසරුග් බඳු අසනීපයක් මොහොතකින් සුවවෙයි. ඒ උපන් වාසනා ගුණයක්. අත්වාසියක් අත් ගුණයක්. ඉස්සර ගැමි කාන්තාවෝ ගෙදර වැඩට ගන්නට තමන්ගේ අතින්ම තෙල් ටිකක් හිඳ ගත්හ. සෙක්කුවට ගොහින් ලොකු තෙල් තොගයක් හින්දා ගන්නා තෙක් පාවිච්චි කරන්නේ එම අත් තෙල්ය. අසනීපයක් වැළඳුණ විගසින් වෙද ගෙදර දිව්වේ නැත. කලින් අත්බේත් ටිකක් බීලා බැලීමටය ඔවුන් නුරුවව සිටියේ. හොඳ අත්තක් අල්ලා ගැනීමට කවුරු වුවත් කැමැති වන්නෝය. එසේ බලාපොරොත්තු වන සමහරකුට අල්ලපු අත්තයි - පය ගහපු අත්තයි දෙකම වරදින තැන්ද ඇත. එහෙම වෙලාවට අනුන්ට අතපාන්නට සිදුවීමද පුදුමයක් නොවේ. එබන්දන් තමන්ගේ අත පල්ලෙන් වැටුණ විදියට සැළකීමද ඉඳහිටවත් සිදුවෙයි. එහෙම කරන බලවතුන්ගේ අදහස මිනිසුන් අතයට තබා ගැනීමය. අතට පයට වැඩ කාරයන් සිටින උදවියට එසේ කිරීමද සුළු දෙයකි.

අත්ල බලා සාස්තර කීමට අල්ලේ රේඛා පෙනෙන්නට තිබිය යුතුය. අල්ලේ රේඛා මැකුණු දුගියෝද ඇත. මැකෙන්නේ සීනි උලා කෑම එන හොඳ දෙයක් ගැන බලා සිටින්නේ ඇඟිලි ගණන් කරමිනි. ඇහැකට ඇඟිල්ලෙන් ඇනීම අවදානම් සෙල්ලමකි. එසේ වුවද ඇහැට ඇඟිල්ලෙන් අනින තෙක් බලා ඉන්නා අයද ඇත. ඒ අඩන්නටය. නියපිටින් තට්ටු කිරීම සමහර බඩු තේරීමේදී කළ යුතුමය. නියපිටින් තට්ටු කළ පමණින් කඩා වැටෙන උදවියද සිටිති. සමහරකුට පස්ස පැත්ත කසා ගන්නට පවා නියපොත්ත නැත.

සිසිර දිසානායක

මීට මාස කීපයකට පෙරාතුව ''තරු විසිතුරු ගී'' ප්‍රසංගයට සහභාගිවීමට මෙල්බර්න් නුවරට සපැමිණි ශිල්පී ශිල්පිනියන් අතුරින් එක් ශිල්පියෙක් විශාරද දයාරත්න රණතුංග. එය ඉතාමත්ම කලබලකාරී සහ වැඩ බහුලව සිටි මොහොතක් වුණත් රණතුංගයන් ''සන්නස'' සමග කතා බහ කරන්නට අමතක කළේ නෑ. ආගිය තැන්, දැන හැඳුනුම්කම්, සුහද පිළිසඳරෙන් අනතුරුව ''සන්නස' ගී සඳළුව වෙනුවෙන් හඬ අවදි කළා.

'මොන ගීය ගැනද ඔබතුමා කතා කරන්න අදහස් කරන්නේ?''

''අපි ගමු ''මංගල මධු සමය'' ගත ලොමු දැහැ ගැන්වුණාක් සේ දැකිණ. කාලයකට ඉහත දී ඉතාම හැඟීම් බරව ගැයුණ ගායනාවක්. ඒ හැඟීම් බර බවට වචනයෙන් මුල පිරුවේ උපාලි ධනවල විනාත ගේය පද නිබන්ධකවරයායි. ඉතාමත්ම සංවේදී ව විශාරද රණතුංගයන් විසින් ම තනුව යෙදී සංගීතවත් වුණ මේ ගීය

මංගල මධු සමය පතා

වරක් හෝ නිහඬ රාත්‍රියක ශ්‍රවණය කළ කිසිවෙකුට කිසිදිනෙක අමතක නොවන ගීතයක්. ''මට වචන ටික නම් මතකයි. ඒත් ලියන්න කලින් හරිද කියලා බැලුවොත් හොඳයි නේද? ඒක ගී සඳළුවේ වගකීමක්. ඒ ඉල්ලීමට රණතුංගයන් ප්‍රතිචාර දැක්වුයේ වචන එකිනෙක ලියාගන්නට හැකි වන සේ මිමිනිමෙන්.

''එක්දාස් නවසිය හැත්තෑහෙවේදී විතර ගුවන් විදුලියට අධ්‍යක්ෂක ජෙනරාල්වරයා විදියට අලුතෙන් පත්වෙලා ආවේ රිජ්වේ නිලකරත්න මහත්තයා සෑහෙන වැඩක් කළ කෙනෙක්. ඉතින් අපිටත් හරියට වැඩ තිබුණා. නව නිර්මාණ බිහිවුණේ තරගයට වාගේ. ඒ නිසා අපිටත් ඕනකම තිබුණා හැමවෙලාවෙම අළුත් දෙයක්, හරවත් දෙයක් කරන්න.''
''ඔය වතවානුවේ දවසක මම අපේ ගිතමිත්‍ර උපාලිට කිව්වා මොනවා හරි අලුත් දෙයක් ලියල දෙන්න කියලා.
''හොඳ වස්තු බිජයක් එකපාරටම එන්නේ නෑනෙ''

> **මංගල මධුසමය පතා**
> **කුලගෙට ආ රූපිකාව**
> **පාළු ලොවක තනිකර දා**
> **දියඹට යනවා**
> **කුසගින්දර නිවාගන්න**
> **දියඹට යනවා**
>
> **රැල්ල බිඳෙන අදෝනාව**
> **ජීවන මළ පොත කියවයි**
> **නිමි නැති නිමි වළලු පෙළේ**
> **සම්පත ඇය සැනසුමයි**
> **ඇය මට අත වනනු පෙනේ**
> **ඉවුරු කොනේ අතුපැළේ**
>
> **අඳුර දවන තාරකාව**
> **කළු ලන්තෑරුම් එළියයි**
> **ඔරු බඳ තුරුළේ දැනුනේ**
> **ඊයේ ලද උණුසුමයි**
> **ඇය මට අත වනනු පෙනේ**
> **ඉවුරු කොනේ තොටුපළේ**

උපාලි ටිකක් වෙලා කල්පනා කරලා කිව්වා.'' රණතුංගයන් උපාලි නමින් හඳුන්වන්නේ මුලින් සඳහන් කළ උපාලි ධනවලවිතාන පද නිබන්ධකවරයාවයි.

''හිවාඩු දවසක් බලලා යමු අපි කොළඹින් පිට ඉ '' මම යෝජනා කළා. ඔය කිව්වා වගේම පස්සෙ දවසක මගේ වාහනේම කොළඹින් පිටවෙලා දකුණු දිහාවට ගියා. ටික දුරක් ගිහින් මම මුහුදු වෙරළ ළඟින් තියෙන හරියක වාහනේ නවත්තලා ඒ ළඟ තිබුණ ගල් පරය දිහාවට ගියා. උපාලිත් මා එක්ක ඇවිත් ගල්පරය උඩ වාඩි වුණා. ටික වෙලාවක් අපි කතා කර කර ඉන්නකොට අපි දැක්කා වෙරළ අයිනේ තිබුණ පැල්පතකින් ජෝඩුවක් එළියට යනවා. මේ තරුණ ජෝඩුවක්. තරුණයා මුදු යන්න ඕන කරන ආම්පන්නත් අතින් කටින් අරගෙනයි ගියේ. ධීවර තරුණයාගේ බිරිඳත් ඔරුව ළඟට ගිහින් ඔරුව දියඹට යනකල්ම එතනට වෙලා බලා හිටියා. එදා මුහුදත් රළුයි.

''තව රස්තියාදු වෙන්න ඕන නෑ. අපි යමු ආපනු'' උපාලි කිව්වා. මම ඉතින් උපාලි එක්ක ආපහු හැරුණා.

''මේ විදියට අඹු සැමි යුවලක් වෙන්නේ මොනතරම් බලාපොරොත්තු ඇතිවද? මූද කොයිතරම් රළු වුණත් අග හිඟකම් නිසා මුදු රස්සාවට යන්න වෙනවා. මේ ගියාට එයිද කියලා අපිටවත් හිතාගන්න බෑ. ඒ ආවත් එතකල් අර තරුණ බිරිඳ තනියම නේද? මේ සිතුවිලි තවත් උද්දීපනය වෙන්නත් එක්ක උපාලි තමන්ගේ පද රචනාව කලේ කලින්දා විවාපත් වුණ යෞවනයෙකුගේ අදෝනාවක් විදියට.'' සංවේදී ගේය පද රචකයෙකුගේ පද පෙළක ආශ්චර්යයි ඒ. ගීතයට මුල පුරන්නේ ම තමන්ට අහිමි වන මංගල මධුසමය නාමයෙන්මයි.

'මම මේ වචනවලට දැම්මේ මුහුදු රැල්ලත් එක්ක එක තනුවක්. 'දර්ධාරි කානවා'' කියන්නේ උත්තර ඉන්දීය රාග අතර බොහෝම ගැඹුරු රාගයක්.'' මේ රාගයෙන් මම ස්පර්ශ කරපු ලක්ෂණය තමයි මුහුදු රැල්ලේ ආය ආය එන වළලු ආකාරය. ඒ ලක්ෂණය ස්වරවලට මුහුකරන්න මම උනන්දු වුණා. ඉතින් මේ විදියට නිර්මාණය කරපු තනුව සරළ ගීයකට වඩා තරමක් දුරට භාවාත්මක බවක් මට දැනුණා. ඒ නිසා මම මේක සරත් අල්විස් ට දීලා කිව්වා ටිකක් සරළ විදියට ගීතය හඳලා දෙන්න කියලා. අපි දැන් අහන සින්ඳුව ඒ විදියට සම්පූර්ණ වුනේ සරත් අතින්. මම ඉල්ලපු විදියටම ධීවර ජීවිතයේ කර්කෂ, කටුක බවත්, දුක දනවන හැඟීම් බර බවත් රැකගෙන සරත් මේ ගීතයේ කටයුතු ඉවර කළා.

මොනතරම් සුන්දර අත්දැකීමක් ද මේ?'' ''බදාගෙන වළඳනවාට වඩා බෙදාගෙන වැළඳීමේ'' අපූර්වත්වයයි මේ. කෙසේ වුවද දයාරත්න රණතුංග විශාරදවරයාණන්ගේ ගායනය පිළිබඳව ද මෙහිදි සටහන් කළ යුතුමයි. මුලින්ම සටහන් කළා සේම රණතුංගයන් කළ ඒ හැඟීම් බර ගායනය හිමිවන්නේ ගීය අවසානයේ ඉතාම ඉහළ ස්වර හා පහළ ස්වර අතර දෝලනය වන 'ආලාපයකින්''ගී සඳළුව ලිපිය රණතුංගයන්ට සිතුතිවන්තව සමුදෙමින් හිමා වෙන්නේ ඒ ආලාපයේ ස්වර සංගතියත්, හඬත් මුහු වූ මනෝමය දෝංකාරයේ ආශ්ලාදයෙන්.

සම්බන්ධීකරණය වෙනුවෙන් සුනිල් හා විජිතා තලේරත්න සුවලට තුති.